# ව්‍යවහාර සිංහලයේ නාම යෝජනය

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සඳහා

පුඤ්චිබණ්ඩා මීගස්කුඹුර විසින්

ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි.

PERMANENT REFERENCE

FOR USE IN THE
LIBRARY ONLY

250011

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය. 1966.

## සම්පිණ්ඩණය

පළමුවැනි පරිච්ඡේදයෙහි වින්‍යාස කරන ලද වචන ගණ ද සම්බන්ධ කරගෙන ව්‍යවහාර සිංහලයේ නාම යෝජන විධි මෙම නිබන්ධනයේ දක්වා ඇත. වචන ගණ විභාගයේ දී නාම වචනය පිළිබඳ ආකෘතිකමය වූත්, කාර්‍ය්‍යමය වූත් නිර්වචනයක් දීමට උත්සාහ කරන ලදි.

දෙවැනි පරිච්ඡේදයේ ප්‍රත්‍ය ක්‍රමයෙහි පිහිටා නාම වචනයෙහි ලිංග, නිශ්චිත අවිනිශ්චිත භේද, වචන භේද ආදි <u>ව්‍යාකරණමය භේද</u> දක්වා, ලිංග භේදය පදනම් කොට ගෙන ප්‍රත්‍ය ක්‍රමය වින්‍යාස කර ඇත. තුන්වැනි පරිච්ඡේදය විශෙෂ නාම ගණයක් වූ සර්වනාම - ආදේශකනාම විභාගය සඳහා ය. විශෙෂයෙන් ම සර්වනාම ආදේශය පිළිබඳව එවැනි විස්තර වේ. නාම ප්‍රකෘති සම්බන්ධ ව්‍යුත්පත්ත විධියත්, සමාස විධියත් සිව්වැනි පරිච්ඡේදයේ අන්තර්ගත වේ.

නිබන්ධනයේ ඉතිරි කොටස නාමපද යෝජනය ම මුල් කරගෙන පවතී. එය විවිධ අර්ථ පරිසරයන්හි යෙදෙන අයුරු (යෝග) පස්වැනි පරිච්ඡේදයෙහි දැක්වේ. විභක්ති ප්‍රත්‍ය හා විභක්ති නිපාත යෝජනය මෙහි ලා විග්‍රහ වේ. හය වැනි පරිච්ඡේදයෙන් විවිධ වාක්‍යාකෘතීන්හි නාම යෝජනය වන ආකාරය විස්තර කර ඇත. නාම යෝජනය සම්බන්ධ ඉතා වැදගත් ලක්ෂණය වන වාක්‍ය ඛණ්ඩ සාධනයත්, ඒවායේ අනුක්‍රම සූචක වර්ග විභාගයත් සත්වැනි පරිච්ඡේදයෙහි ගැබ් වේ.

මෙය ප්‍රධාන වශයෙන් ම නාම යෝජනය පිළිබඳ නිබන්ධනයක් වන හෙයින්, මුල පටන් ම ඇති යෝජනය පිළිබඳ සටහන් නිබන්ධනයේ මූලික කාර්‍ය්‍යයට අනුරූප ව දක්වා ඇත.